රහසිගතයි

අමාත්‍ය මණ්ඩල කාර්යාලය
அமைச்சரவை அலுவலகம்
OFFICE OF THE CABINET OF MINISTERS

CABINET DECISION    අමාත්‍ය මණ්ඩල තීරණය    அமைச்சரவைத் தீர்மானம்

පිටපත් : ජනාධිපති ලේකම්.
අග්‍රාමාත්‍ය ලේකම්.
ජාතික ප්‍රතිපත්ති හා
ආර්.ක.ලේකම්.
මුදල් ලේකම්.
රාජ්‍ය ව්‍යවසාය සං. ලේකම්.
විගණකාධිපති.

මගේ අංකය: අමප/17/0475/727/007
2017 මාර්තු මස 29 දින.

ක්‍රියා කළ යුතු : විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශයේ ලේකම්.

2017 අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීම - විදුලි පාරිභෝගිකයන් තම නිවාස/පරිශ්‍රවල වහල මත ඉදි කරන සූර්ය විදුලි බලාගාර සඳහා ණය පොළී සහන ලබා දීම

(විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති ගරු ඇමතිතුමා ඉදිරිපත් කළ 2017-02-15 දිනැති සංදේශය)

2017 මාර්තු මස 21 දින පැවැත්වුණු අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී එළඹි තීරණයක් අවශ්‍ය කටයුතු සඳහා මේ සමඟ එවා ඇත.

ඩබ්ලිව්.එම්.ඩී.ජේ.ප්‍රනාන්දු
අතිරේක ලේකම්.

අ.කලේ/එස්.අබේසිංහ
අමාත්‍ය මණ්ඩලයේ ලේකම්.

(අ) න්‍යාය පත්‍රයේ විෂයයන්:

(I) අමාත්‍ය මණ්ඩල පත්‍රිකා - සාමාන්‍ය:

44. අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 17/0475/727/007 වූ, "2017 අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීම - විදුලි පාරිභෝගිකයන් තම නිවාස/පරිශ්‍රවල වහල මත ඉදි කරන සූර්ය විදුලි බලාගාර සඳහා ණය පොළී සහන ලබා දීම" යන මැයෙන් විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති ඇමතිතුමා ඉදිරිපත් කළ 2017-02-15 දිනැති සංදේශය - (අමප අංක 16/1594/727/027 පිළිබඳව වූ 2016-08-16 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයට අදාළව) ඉහත සඳහන් සංදේශය, අතිගරු ජනාධිපතිතුමාගේ සහ මුදල් ඇමතිතුමාගේ නිරීක්ෂණ සමඟ සලකා බලන ලදී. මේ පිළිබඳව සාකච්ඡා කිරීමෙන් අනතුරුව, පහත සඳහන් පරිදි තීරණය කරන ලදී:

(i) සංදේශයේ (3.0) ඡේදයෙහි සඳහන් (I) සිට (IV) දක්වා වන යෝජනා සඳහා අනුමැතිය ලබා දීම;

(ii) පහත සඳහන් පරිදි විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශයේ ලේකම්ට නියම කිරීම -

(අ) අතිගරු ජනාධිපතිතුමා විසින් මෙ සම්බන්ධයෙන් ඉදිරිපත් කරනු ලැබ ඇති නිරීක්ෂණවල අවධාරණය කරනු ලැබ ඇති කරුණුවලට නිසි සැලකිල්ලක් දැක්වීම; සහ

(ආ) සංදේශයේ සඳහන් (V) යෝජනාවට අදාළව මුදල් ඇමතිතුමාගේ නිරීක්ෂණවල 2 වන ඡේදයේ දක්වා ඇති කරුණු කෙරෙහි නිසි සැලකිල්ලක් දැක්වීම හා ඒ අනුව ක්‍රියා කිරීම.

ක්‍රියා කළ යුතු: විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය - ඉහත නිරීක්ෂණ යා කොට ඇත.

පිටපත්: ජනාධිපති ලේකම් - මුදල් ඇමතිතුමාගේ නිරීක්ෂණ යා කොට ඇත.
අග්‍රාමාත්‍ය ලේකම් - සංදේශයේ පිටපතක් හා ඉහත නිරීක්ෂණ යා කොට ඇත.
ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය - සංදේශයේ පිටපතක් හා ඉහත නිරීක්ෂණ යා කො‍ට ඇත.
මුදල් අමාත්‍යාංශය - අතිගරු ජනාධිපතිතුමාගේ නිරීක්ෂණ යා කොට ඇත.
රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය - සංදේශයේ පිටපතක් හා ඉහත නිරීක්ෂණ යා කොට ඇත.